# තානාපති ඇලයිනා බී. ටෙප්ලිට්ස්
# ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ - ඇමරිකා එක්සත් ජනපද ව්‍යාපාරික කවුන්සිලයේ
# තෙවන වාර්ෂික මහා සභා රැස්වීමේදී පළකළ අදහස්

ජුනි 30, 2019

සුබ සැන්දෑවක්! ශ්‍රී ලංකා ඇමරිකා එක්සත් ජනපද ව්‍යාපාරික කවුන්සිලයේ තුන්වන වාර්ෂික මහා සභා රැස්වීමට ඔබ හා එක්වීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

අද රාත්‍රියේ ඔබ ඇමතීමට මට ආරාධනා කිරීම ගැන අසංක සහ සමන්ත රාජපක්ෂට මගේ ස්තූතිය පුද කරමි. අද දින ව්‍යාපාරික ප්‍රජාවේ සාමාජිකයින් කණ්ඩායමක් ඇමතීමට ලැබීම හොඳ අවස්ථාවක් සේ සලකමි

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සහ ආයෝජන අවස්ථා වර්ධනය කිරීමට උපකාරී වන ඇමරිකානු උත්සාහයන් ගැන වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට මෙම අවස්ථාව ලැබීම ගැන මම ඉතා සතුටු වෙමි. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු වසර 70ක කාලය තුල ඩොලර් බිලියනයකට අධික ප්‍රදානයන් සහ සෘජු සංවර්ධන ආධාර එක්සත් ජනපදය විසින් ලබා දී ඇති අතර ඒ කිසිවක් ආපසු ගෙවිය යුතු නොවේ.

ශ්‍රී ලංකාවේ ලෙඩ රෝග තුරන් කිරීමට, කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ එහි තරුණ තරුණියන්ට අධ්‍යාපනය ලබා දීමට එම අරමුදල් උපකාරී විය. පර්යේෂණ හා සංවර්ධනය දිරි ගන්වා, කලාව ප්‍රවර්ධනය කර, ස්වාභාවික විපත් වලින් පසු යළි ප්‍රකෘති තත්වයට ඒමට මෙම අරමුදල් රටට ප්‍රයෝජනවත් විය. 21 වන සියවසේ හතරෙන් පංගුවකට ආසන්න කාලයක් ගතවී ඇති මේ අවස්ථාවේ ආධාර සපයන්නෙකු හා ආධාර ලබා ගන්නෙකුගේ සම්බන්ධතාවෙන් ඔබ්බට යමින් අපේ හවුල්කාරිත්වය පුළුල් කිරීම සඳහා කටයුතු කළ යුතු වෙමු.

තානාපති වශයෙන්, අපේ ජාතීන් අතර වාණිජ සබඳතා ශක්තිමත් කිරීම මගේ ඉහළම ප්‍රමුඛතා අතර වේ.

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම සහ දිවයිනේ සාමය හා සංහිඳියාව වර්ධනය කිරීම සඳහා ශක්තිමත් හා සියල්ලන් ඇතුළත් වන ආර්ථික වර්ධනයක් අත්‍යවශ්‍ය බව එක්සත් ජනපදය විශ්වාස කරයි. තවද ශ්‍රී ලාංකික ජනතාවගේ අනාගත සමෘද්ධිය සඳහා සියලු දෙනාගේම ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය සාධකයක් වේ.

අවංකවම කිවහොත්, සියල්ලන් ඇතුළත් වන ආර්ථික වර්ධනයේ අවශ්‍යතාව සියලු ජාතීන් සම්බන්ධයෙන් සත්‍ය වේ. නැගී එන වඩදිය, සියලු ඔරු ඔසවයි යනුවෙන් කියමනක් තිබේ.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් සම්මුතිය (MCC) ගැන ඔබ සමඟ කතා කිරීමට මම බලාපොරොත්තු වන්නේ මෙම සන්දර්භය තුළ යි.

මෙම යෝජිත ගිවිසුම පිළිබඳ ප්‍රධාන කරුණුවලින් ආරම්භ කිරීමට මට ඉඩ දෙන්න:

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) යනු සංවර්ධන ආධාර සපයන එක්සත් ජනපද රජයේ ආයතනයකි. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) ගැන ඔබ අසා ඇති බව මට විශ්වාසයි. මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය ද එයට සමාන යි, නමුත් එහි ව්‍යාපෘති දැඩි ලෙස කාලබද්ධ වන අතර එය විශාල යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමු කරයි.

2004 වර්ෂයේ සිට එක්සත් ජනපදය ලොව පුරා රටවල් 29 ක ක්‍රියාත්මක කළ මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) සම්මුති 37 ක් සඳහා ඩොලර් බිලියන 14 ක් ආයෝජනය කර තිබේ. උදාහරණයක් වශයෙන් එක්සත් ජනපද රජය (USG) විසින් ජෝර්ජියාවේ, විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ වෛද්‍ය ක්ෂේත්‍රවල ජාත්‍යන්තරව පිළිගත් උපාධි සංඛ්‍යාව වැඩි කරයි. සෙනෙගල් රටේ, විශ්වසනීය විදුලිය සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා බලශක්ති අංශය ශක්තිමත් කරයි. දකුණු ආසියාවේ පළමු මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ගිවිසුම අත්සන් කිරීමේ ගෞරවය මට හිමිවූ නේපාලයේ, අඩු බලශක්ති සැපයුම සහ ඉහළ බලශක්ති ප්‍රවාහන වියදම් පිළිබඳ ගැටළුව විසඳීමට මෙම අරමුදල් යොදා ගැනේ. ඔබ මාධ්‍ය තුළ කියවා ඇති "සම්මුතිය" - ඇත්ත වශයෙන්ම, ඔබ සංවිධානයේ සාමාජිකයන් සමඟ කිහිප වතාවක් සාකච්ඡා කළ සංවර්ධන ආධාර ගිවිසුමකි. ඊට වඩා දෙයක් එහි නැත, ඊට අඩු කිසිවක් ද එහි නැත.

ශ්‍රී ලංකාව ගැන කුමක් කිව හැකිද: සියල්ලන් ඇතුළත් වන ආර්ථික වර්ධනය හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවේ රජයට සහ ජනතාවට ඩොලර් මිලියන 480 ක ප්‍රදානයක් ලබා දී ඇත. මෙය එක්සත් ජනපදයේ ජනතාවගෙන් ලැබෙන තෑග්ගක් මිස ණයක් නොවේ. එය මේ රටේ අනාගතය උකසට තබන ණයක් නොවේ.

මෙම ආධාරයෙන් ලැබෙන සහාය කුමක් ද? ප්‍රවාහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකා රජයේ ඉඩම් පරිපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමයි - මේ සියල්ල නිසා ශ්‍රී ලංකාවේ ණය එක රුපියලකින්වත් වැඩි නොවේ.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ප්‍රදානය සම්බන්ධයෙන් මාධ්‍ය තුළ සැලකිය යුතු වැරදි තොරතුරු පළවී තිබේ. එබැවින් මේ සම්බන්ධ තවත් කරුණු කිහිපයක් ඔබ සමග බෙදා හදා ගැනීමට මම කැමැත්තෙමි.

මෙම වාණිජ මණ්ඩලය ද ඇතුළත් වන පුද්ගලික අංශයේ සහ සිවිල් සමාජයේ සැලකිය යුතු දායකත්වයක් සහිතව ශ්‍රී ලංකා හා එක්සත් ජනපද රජයන් සහයෝගීව කටයුතු කරමින් යෝජිත ගිවිසුම සකස් කරන ලදී.

මේ රටේ ආර්ථික වර්ධනයට ඇති ප්‍රධානම බාධක ලෙස ප්‍රවාහනයේ හා ඉඩම් පරිපාලනයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඇත. මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ප්‍රදානය මගින් අවධානය යොමු කර ඇති අංශ දෙක වන්නේ ඒවායි.

මෙම ගිවිසුම යටතේ යෝජිත ව්‍යාපෘතිවල සියලු අංශ අධීක්ෂණය හා පාලනය ශ්‍රී ලංකාව විසින් රඳවා ගනු ඇත. ඒවා අතර වැඩිදියුණු කරන සියලුම මාර්ග, සියලු රථවාහන සංඥා සහ බස් ජාල වැඩි දියුණු කිරීම; ඉඩම් වාර්තා ඩිජිටල්කරණය කිරීමට සහ නිවැරදි ඉඩම් මැනුම් ඉදිරිපත් කිරීමට දරන උත්සාහයේ සෑම අංශයක්ම වේ. මෙම ගිවිසුම යටතේ කිසිදු ඉඩමක් අයිති කර ගැනීමට, පාලනය කිරීමට හෝ කිසිදු ආකාරයකින් පරිපාලනය කිරීමට එක්සත් ජනපදයට නොහැකි වනු ඇත.

හොඳයි. දැන් අපි සියලු කරුණු දන්නා බැවින් මෙහි "මට ඇත්තේ කුමක්ද" (WIIFM) යන්න ගැන කතා කරමු. ඔබ ව්‍යාපාරවල යෙදී සිටින බැවින් මේ ගැන ඔබ අසා ඇති බව මට විශ්වාසයි. එබැවින්, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ප්‍රදානයෙන් ලැබෙන්නේ කුමක්ද යන්න ගැන කතා කරමු.

සම්මුතිය යටතේ ඇති පළමු ව්‍යාපෘතියෙන් ආරම්භ කිරීමට මම කැමතියි, එය නිසැකවම ඔබේ ව්‍යාපාරයට සහ ඔබේ පෞද්ගලික ජීවිතයට බලපායි. එය උසස් රථවාහන කළමනාකරණ පද්ධතියක් සහ බස් නවීකරණ වැඩසටහනක් හරහා මාර්ග තදබදය අවම කිරීමට අවධානය යොමු කරන ව්‍යාපෘතියකි.

ශ්‍රී ලංකාවේ ආර්ථික විභවය මුදාහැරීම සඳහා වැඩි දියුණු කළ සංචලතාවක් අත්‍යවශ්‍ය වේ. මොරටුව විශ්ව විද්‍යාලයේ 2014 අධ්‍යයනයකට අනුව කොළඹ, එහි තදාසන්න ප්‍රදේශ හා සම්බන්ධ කරන ප්‍රධාන මාර්ග කොරිඩෝවල දිනකට ගමන් වාර මිලියන 1.9 ක් සිදුවේ. 2035 වන විට එම සංඛ්‍යාව දිනකට ගමන් වාර මිලියන 4.5 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්තමාන රථවාහන ප්‍රමාණය දෙගුණයක් වීම ගැන සිතන්න. එම රථවාහන තදබදය සඳහා ගෙවීමට සිදු වන්නේ ඔබට බවත් සිතන්න.

මෙම තදබදය අවම නොකළ හොත් ඔබට කරන්නට සිදු වන්නේ එයයි. මොරටුව විශ්ව විද්‍යාලයේ ඇස්තමේන්තුවලට අනුව තදබදයේ ආර්ථික පිරිවැය, බොහෝ දුරට දිගු ගමන්වල ප්‍රතිඵලයක් ලෙස අහිමි වූ කාලයෙන් පිළිබිඹු වන අතර එය 2014 දී වසරකට රුපියල් බිලියන 400 ක් විය. 2020 වන විට එය රුපියල් ට්‍රිලියන 1.8 ක් දක්වා ඉහළ යනු ඇත. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර මෙන්ම විශාල ව්‍යාපාරවලට වෙළඳපල වෙත නිෂ්පාදන ප්‍රවාහනය කිරීමට, හෝ වරාය වෙත භාණ්ඩ ගෙන ඒමට හෝ ආකර්ෂණීය ස්ථාන කරා සංචාරකයින් රැගෙන යාම ආදි සියලු කටයුතු සඳහා මෙම මාර්ග යොදා ගැනීමට සිදුවේ.

කොළඹ මාර්ගවල රිය පදවන ඕනෑම කෙනෙකුගේ මනසේ සාමය පවත්වා ගැනීම මෙන්ම මෙම ව්‍යාපාර හොඳින් ක්‍රියාත්මක වීම මාර්ග ජාලය මත රඳා පවතී!

ජනගහනයෙන් අඩක් පමණ ජනයාගේ, විශේෂයෙන් දුප්පතුන්ගේ ප්‍රධාන ප්‍රවාහන ක්‍රමය බස් රථ වන නිසා බස් නවීකරණ ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වේ. මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ප්‍රදානය මගින් සිදු කිරීමට බලාපොරොත්තු වන කටයුතු අතර ස්මාර්ට් කාඩ්පත් මත පදනම් වූ ස්වයංක්‍රීය ගාස්තු එකතු කිරීමේ ක්‍රම හඳුන්වාදීම සහ

රාජ්‍ය හා පෞද්ගලික බස්රථ ක්‍රියාකරුවන්ට නව අති නවීන බස් රථ මිලදී ගැනීමට  සහාය වීමද වේ.

මෙහි ඇති වටිනාම යෝජනාව  වන්නේ, මෙම ගැටළුව විසඳීම සඳහා එක්සත් ජනපද රජය ඩොලර් මිලියන 350 ක් ලබා දීමට කැමැත්තෙන් සිටින අතර මධ්‍යම, සබරගමුව, ඌව සහ නැගෙනහිර පළාත් සම්බන්ධ කරන අන්තර් පළාත් මාර්ග කිලෝමීටර් 131 වැඩිදියුණු කරමින්  බස්නාහිර පළාතේ වෙළඳපල සහ වරාය සමඟ සම්බන්ධ කර මෙම ගැටලුව විසඳීමට සහාය වීමයි.  එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය වර්ධනය වේ යැයි එක්සත් ජනපදය බලාපොරොත්තු වේ. එහි අපට ඇත්තේ කුමක්ද? ශක්තිමත් ආර්ථිකයක් විසින් බිහි කරන  විශිෂ්ට අවස්ථා පෞද්ගලික අංශයට  විවෘත වනු ඇත. නැගී එන වඩදිය  සියලුම ඔරු ඔසවනු ඇත.

මෙම වැඩසටහනේ ඉඩම් පරිපාලනය පිළිබඳ කොටස බොහෝ අවධානයට ලක්වී තිබේ. මෙයින් ශ්‍රී ලංකාවේ රජයට, ජනතාවට සහ ව්‍යාපාර සඳහා  වූ  ප්‍රයෝජන වන්නේ  පැහැදිලි, මාරු කළ හැකි  ඉඩම් ඔප්පු  පුද්ගලයන්ට ලබා දෙන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ  තුලින් වඩාත් ක්‍රියාශීලී ඉඩම් වෙළඳපොළක් සංවර්ධනය කිරීම සහ ඉ-රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය සහ ඉ-ඉඩම් රෙජිස්ටරය වැනි දැනටමත් භාවිතයේ පවතින ඉඩම් තොරතුරු හා ලියාපදිංචි කිරීමේ ඩිජිටල් පද්ධති ශක්තිමත් කිරීමයි.

නිදසුනක් වශයෙන්, වඩා හොඳ ඉඩම් තොරතුරු පද්ධතියත් සමඟ, අනාගතයේ  ශ්‍රී ලංකා රජයට සියළුම රජයේ ඉඩම්වල ප්‍රමාණය, විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු ඉඩම් ප්‍රමාණ සහ මෙම ඉඩම්වල වටිනාකම පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබා ගත හැකි වනු ඇත.

මීට අමතරව, ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඔවුන්ගේ ඔප්පු  ඩිජිටල් ආකාරයකට පරිවර්තනය කිරීමට හැකි වන අතර, ඔවුන්ගේ ලේඛන  හානිවීමෙන්,  නැතිවීමෙන් හෝ සොරකම් කිරීමෙන් ආරක්ෂා  කර ගත හැකි වේ. විනිවිදභාවය සහ වගවීම ව්‍යාපාරවලට  යහපත් වන අතර පුද්ගලයන්ටද  යහපත් වේ..

එක්සත් ජනපදයට මෙහි  ඇත්තේ කුමක්ද? මගේ ප්‍රධාන ප්‍රමුඛතාවක් වන්නේ  අපේ රටවල් අතර වාණිජ සබඳතා ශක්තිමත් කිරීමයයි මා ප්‍රකාශ කළ බව ඔබට මතක ඇතැයි සිතමි. සමහර රටවල් රජය සතු සමාගම්වලට  සහනාධාර ලබා දීමෙන් හෝ හොර ගනුදෙනු තුළින්  වාණිජ කටයුතු ප්‍රවර්ධනය කරයි. එක්සත් ජනපදය, ව්‍යාපාර ප්‍රවර්ධනය කරන්නේ ආර්ථිකයන් වැඩිදියුණු කිරීමට උදව් කිරීමෙන්, පුද්ගලික අංශයට තරඟ කිරීමට වැඩි අවස්ථාවන් නිර්මාණය කිරීමෙන් සහ ප්‍රජාවට සමෘද්ධිමත් වීමට වැඩි අවස්ථාවන් නිර්මාණය කිරීමෙනි.

එබැවින්, ඇමරිකානු දෘෂ්ටි කෝණයෙන් බලන කල, දියුණු වෙමින් පවතින, වර්ධනය වන ශ්‍රී ලංකාව එක්සත් ජනපද භාණ්ඩ හා සේවා සඳහා වඩාත් ගතික වෙළඳපොලක් වනු ඇතැයි යන්න ගැන ඔබ පුදුම නොවනු ඇත. අපි දැනටමත් ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ හවුල්කරු මෙන්ම අංක එකේ අපනයන ගමනාන්තයයි. පුළුල් වන ආර්ථිකයක් ව්‍යාපාරික අවස්ථා

වැඩි කරන අතර දුප්පත්කම තුරන් කිරීමටද ඉඩ සලසයි. එයින් අදහස් කරන්නේ අපේ රටවල් දෙකටම ජය හිමිවන ක්‍රමයක් බවයි. මට සහ ඔබට මෙහි ඇත්තේ එයයි.

අවසාන වශයෙන්, අනාගතයේ දියුණු වෙමින් පවතින ගෝලීය ආර්ථිකය නිර්මාණය කිරීමේදී පෞද්ගලික අංශයට ප්‍රධාන කාර්යභාරයක් පැවරෙන බව මම විශ්වාස කරමි.

වඩා ඵලදායි ලෙස වැඩ කිරීමට අපට උපකාරී වන නව අදහස්, නව ප්‍රවේශයන් සහ වඩාත් ඵලදායී හා දැරිය හැකි නිෂ්පාදන සහ සේවාවන් අපි අගය කරමු. ඇත්ත වශයෙන්ම, www.mcc.gov වෙබ් අඩවියේ "අප සමඟ වැඩ කරන්න" (work with Us) පිටුවෙන් ඔබට සොයාගත හැකි ප්‍රසම්පාදන, හවුල්කාරිත්ව සහ ආයෝජන අවස්ථා සොයා බැලීමට මම මෙම වාණිජ මණ්ඩලය දිරිමත් කරමි. මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය වෙනත් රටවල් සමඟ අත්සන් කර ඇති ගිවිසුම් සියල්ලම මෙම වෙබ් අඩවියකින් බලා ගත හැකියි.

ශක්තිමත්, ස්වෛරී සහ දක්ෂ ජාතීන් එකට එකතු වූ විට ලෝකය ටඩා ආරක්ෂිත මෙන්ම වඩා සුරක්ෂිත වේ. විනිවිද පෙනෙන හා සියල්ලන් ඇතුළත් වන ආර්ථික වර්ධනයකින් ජීවන තත්වය වැඩිදියුණු වන බව අප දන්නා නිසා එක්සත් ජනපදය ලොව පුරා ආර්ථික අවස්ථා පුළුල් කිරීමට කටයුතු කරයි. නැගී එන වඩදිය සියලු ඔරු ඔසවයි .

ඔබ සැමට ස්තුතියි.